සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019(II)**

| කාලය: පැය 03 | පරිපාලනය (02-III) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |
|---|---|---|

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

1\. I. බඳවා ගැනීමේ පටිපාටියක් හෝ සේවා ව්‍යවස්ථාවක් අනුමත කර ගන්නා ආකාරයන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

II. බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාවක අන්තර්ගතවිය යුතු වැදගත් කරුණු අටක් (08) නම් කරන්න. (ලකුණු 12)

2\. I. රාජ්‍ය සේවයට බඳවා ගැනීමට නුසුදුසු තැනැත්තන් වන්නේ කවුරුන්ද? (ලකුණු 10)

II. රජයේ සේවයේ නිලධාරියකු සේවයට පත්වූ පසු අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අනුව පැහැදිලි කරන්න. (ලකුණු 10)

3\. I. වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වූ නිලධරයකු නැවත සේවයේ පිහිටුවිය හැකි ආකාරය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. රජයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීමෙන් අපේක්ෂිත අරමුණු මොනවාද? (ලකුණු 10)

4\. I. රජයේ නිලධාරියකුගේ සාමාන්‍ය හැසිරීම පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 10)

II. චෝදනා ලත් රජයේ නිලධාරියකුට ලබා දෙනු ලබන චෝදනා පත්‍රයක අන්තර්ගත වැදගත් කරුණු පහක් (05) නම් කරන්න. (ලකුණු 10)

5. I. රජයේ නිලධරයෙකු තම රාජකාරි කටයුතු කරගෙන යන අතරේ දී තමාට ලැබුණු විෂය ප්‍රවීණත්වය හා පහසුකම් ආදී උපයෝගී කරගෙන නව නිපැයුමක් සිදුකළ හොත් ඒ සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගනු ලබන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. රජයේ නිලධාරියෙකුට වැඩබැලීමේ වැටුප් ගෙවිය හැකි ආකාර පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10)

6. I. රජයේ නිලධරයෙකුට වැටුප් වර්ධකයක් ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකි ආකාර මොනවාද? ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. රජයේ නිලධරයකු උසස් වන අවස්ථාවකදී උසස් කිරීමේදී වැටුප් ගෙවන ආකාරය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 10)

7. පහත සඳහන් මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. තනතුර අතහැර යාම
II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
III. පත්වීමක් පෙරදාතම් කිරීම
IV. ලඝු විනය පටිපාටිය (ලකුණු 5X4 = 20)

**************